Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2018.03.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය.

## 1. <u>ප්‍රවාහන නිලධාරි තනතුර</u>

1.1 *වැටුප් පරිමාණය :*

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 43,565 - 9 x 755 / 6 x 930 - රු. 55,940 වේ. එබැවින්, පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 34,563 ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලු අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ මූලික ආරම්භක දළ මාසික වැටුප රු. 70 000.00 පමණ වේ.)

ප්‍රවාහන නිලධාරි තනතුරේ අවුරුදු 10 ක සතුටුදායක සේවයකින් පසු ජ්‍යෙෂ්ඨ ප්‍රවාහන නිලධාරි තනතුරට උසස් කරනු ලැබේ. එම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,340 - 3 x 755 / 13 x 1,030 - රු. 62,995

1.2 *වයස :*

ඉල්ලුම්පත් කැඳවීම අවසාන වන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවල ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

1.3 අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/ දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා/පෙළ) විභාගය විෂයයන් 6 කින් සමත් වී තිබීම;

සහ

අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී ඉංජිනේරු විෂයයන් එක්වරක දී සමත් වීම.(පැරණි නිර්දේශය යටතේ විෂයයන් 4කින් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් 3 කින්)

1.4 *වෘත්තීය සුදුසුකම් :*

- ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) - (යාන්ත්‍රික) හෝ
- ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES) - (යාන්ත්‍රික) හෝ
- ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) - (යාන්ත්‍රික) හෝ
- විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමන තාක්ෂණික ඩිප්ලෝමාව - (යාන්ත්‍රික) හෝ
- ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මගින් පවත්වනු ලබන මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ වසර 4 ක පූර්ණ කාලීන පාඨමාලාව හෝ
- රැකියා ක්ෂේත්‍රයට අදාළව NVQ 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම හෝ
  ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකමක්.

1.5 *අමතර සුදුසුකම් :*

- සියලුම වර්ගවල වාහන සහ මෝටර් සයිකල් පැදවීමට රියදුරු බලපත්‍රයක්
- වාහන සඳහා අවශ්‍යවන අළුත්වැඩියාකිරීම් නිශ්චය කිරීම හා සාමාන්‍ය අළුත්වැඩියා කිරීම් පරීක්ෂා කොට ඒ පිළිබඳ වාර්තා කිරීමට හැකියාව
- පෙට්‍රල් හා ඩීසල් වාහන නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳව ඉතා හොඳ දැනීමක් තිබීම
- පෙට්‍රල් හා ඩීසල් වාහනවල සුළු අළුත්වැඩියාවන් සිදුකිරීමේ හැකියාව
- කම්කරු පිරිස් පාලනය, මෝටර් සයිකල් ද ඇතුළුව රථවාහන කාණ්ඩයක් නඩත්තු කිරීම හා රථවාහන ඒකකයක් පාලනය කිරීම පිළිබඳ හැකියාව

1.6 *පළපුරුද්ද :*

පිළිගත් ආයතනයක ප්‍රවාහන නිලධාරි ලෙස හෝ මෝටර් රථ කාර්මික ක්ෂේත්‍රයේ අධීක්ෂක මට්ටමේ තනතුරක වසර 5 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

1.7 *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත/ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 2.0 <u>පුහුණු කම්කරු (සිවිල්)</u>

2.1 *රැකියාවේ ස්වභාවය :*

වඩු, පෙදරේරු, ජලනල සවිකිරීම, වෑද්දුම්, පින්තාරු, හා නල පවිත්‍ර කිරීම වැනි සිවිල් ක්ෂේත්‍රයට අදාළ කටයුතුවලට සහාය දීම.

2.2 *වැටුප් පරිමාණය* :

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.25,520-9 x 270/10 x 300/6 x 330- රු. 32,930 වේ. එබැවින්, පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 20,248 ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දල මාසික වැටුප රු. 50,000.00 පමණ වේ.)

"පුහුණු කම්කරු (සිවිල්)" තනතුරේ අවුරුදු 10 ක සතුටුදායක සේවයකින් පසු "ජ්‍යෙෂ්ඨ පුහුණු කම්කරු (සිවිල්)" තනතුරට උසස් කරනු ලැබේ.

2.3 *වයස් සීමාව* :

2018 මාර්තු මස 15 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පලාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයට මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

2.4 *අධ්‍යාපන සුදුසුකම්* :

සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(*සටහන*.- ඉහත දක්වා ඇති ක්ෂේත්‍රයන්ගෙන් කුමන හෝ ක්ෂේත්‍රයකට අදාලව පිළිගත් රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් NVQ 3 හෝ ඉහළ මට්ටමේ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ඇත්නම් ඉහත සුදුසුකම අනිවාර්ය නොවේ.)

2.5 *වෘත්තීය සුදුසුකම්* :

වඩු, පෙදරේරු, ජලනලකරු, වෑද්දුම්කරු, නල පවිත්‍රකරු හෝ පින්තාරුකරු යන ක්ෂේත්‍රයක NVQ Level 2 හෝ ඉහල මට්ටමේ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

2.6 *පළපුරුද්ද* :

පිළිගත් ආයතනයක ඉහත 2.5 හි සඳහන් ක්ෂේත්‍රයක වසර 3 කට නොඅඩු පලපුරුද්දක් තිබීම.

2.7 *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත/ වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

3.0. *සේවා නියමයන් හා කොන්දේසි* :

3.1. මෙම තනතුරු ස්ථිරය. මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

3.2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

3.3 තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතුය.

3.4 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

4.0 අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(*අ*) උප්පැන්න සහතිකය;
(*ආ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(*ඇ*) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(*ඈ*) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

5.0 රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

6.0 තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

7.0 අයදුම් පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරැදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

8.0 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2018 මාර්තු මස 02 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**ප්‍රවාහන නිලධාරී තනතුර සඳහා ආදර්ශ අයදුම්පත**

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..................................................................................................
..................................................................................................(මයා/ මිය/ මෙනෙවිය)

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :..................................................................................
..................................................................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(Mr./Mrs./Miss.)..........................................................................................................
................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................................

03. (අ) පෞද්ගලික ලිපිනය : ..................................................................................................
..................................................................................................................................
.....................................
දුරකථන අංකය : ..................................................................................................

(ආ) කාර්යාලීය ලිපිනය : ..................................................................................................
..................................................................................................................................
.....................................

දුරකථන අංකය : ..................................................................................................

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :
පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (අ) උපන් දිනය : ..................................................................................................
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(ආ) 2018.03.15 වැනි දිනට වයස : අවුරුදු ...........මාස : ...................දින :.................

05. විවාහක/ අවිවාහක බව : ..................................................................................................

06. ස්ත්‍රී/ පුරුෂ භාවය : ..................................................................................................

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : ..................................................................................

08. අධ්‍යාපන සුදුසුකම් : (සහතික වල පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | සිංහල/ දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| අ.පො.ස (උ/පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |

09. උසස් අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.) :
.....................................................................................................................................
.....................................................................................................................................

10. වෘත්තීය සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)
.....................................................................................................................................
.....................................................................................................................................

11. පළපුරුද්ද : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)
.....................................................................................................................................
.....................................................................................................................................

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය : ..............................................................................
(ආ) මුල් පත්වීමේ දිනය : ..........................................................................................
(ඇ) දැනට දරන තනතුර : ..........................................................................................
(ඈ) මාසික මූලික වැටුප : .........................................................................................
(ඉ) දීමනා : ..............................................................................................................
(ඊ) දළ වැටුප : ........................................................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද ?
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :
.....................................................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :
.....................................................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය : ........................................ ..........................................................
අයදුම්කරුගේ අත්සන.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ...............................තනතුර දරන,.......................මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

දිනය :-............................... ..........................................................,

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.

(නිල මුද්‍රාව)

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

පුහුණු කම්කරු (සිවිල්) තනතුර සඳහා ආදර්ශ අයදුම්පත

01. (*අ*) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..........................................................................................................................................(මයා/ මිය/ මෙනෙවිය)

(*ආ*) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ..........................................................................................................................................

(*ඇ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(Mr./Mrs./Miss.) ..........................................................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................................

03. (*අ*) පෞද්ගලික ලිපිනය : ..........................................................................................................................................

දුරකතන අංකය : ....................................................................................

(*ආ*) කාර්යාලීය ලිපිනය : ..........................................................................................................................................

දුරකතන අංකය : ....................................................................................

(*ඇ*) ප්‍රවේශ පත්‍රය තැපැල් කළයුතු ලිපිනය :
පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (*අ*) උපන් දිනය : ....................................................................................
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(*ආ*) 2018.03.15 වැනි දිනට වයස : අවුරුදු ...........මාස : ...................දින : .................

05. විවාහක/ අවිවාහක බව : ....................................................................................

06. ස්ත්‍රී/ පුරුෂ භාවය : ....................................................................................

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : ....................................................................................

08. *අධ්‍යාපන සුදුසුකම්* : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| *විභාගය* | *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | සිංහල/ දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. *වෘත්තීය සුදුසුකම්* : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)
.....................................................................................................................................
.....................................................................................................................................

10. *පළපුරුද්ද* : (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
.....................................................................................................................................
.....................................................................................................................................

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර
(*අ*) ආයතනයේ නම හා ලිපිනයඃ-...............................................................................................
(*ආ*) මුල් පත්වීමේ දිනයඃ-..........................................................................................................
(*ඇ*) දැනට දරන තනතුරඃ-..........................................................................................................
(*ඈ*) මාසික මූලික වැටුප ඃ-.........................................................................................................
(*ඉ*) දීමනා ඃ-.............................................................................................................................
(*ඊ*) දළ වැටුපඃ-...........................................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්නඃ-
.....................................................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? එසේ නම් එම විස්තර සඳහන් කරන්න.
.....................................................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය : ........................................ ..........................................................,
අයදුම්කරුගේ අත්සන.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**
(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ...............................තනතුර දරන,........................මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

දිනය : .................................... ..............................................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)